AL/2017/41/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය I<br>பௌத்தம் I<br>Buddhism I | 41 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.

※ උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

**1.** දෙව්රම් වෙහෙර වැඩ සිටි බුදුරජාණන් වහන්සේ දිනක් භික්ෂූන් වහන්සේලා අමතා මෙසේ ප්‍රකාශ කළහ. "මහණෙනි අන් අයගේ සිත් හසර නොදන්නා විමසුම්ශීලී පැවිද්දා විසින් කරුණු දෙකක් අරබයා තථාගතයන් වහන්සේ විමසා බැලිය යුතු ය. එනම් උන්වහන්සේගේ කාය සමාචාරය සහ වාක් සමාචාරයයි." මෙම ප්‍රකාශයෙන් ප්‍රකට වන පරිදි සමකාලීන ශාස්තෘවරුන් අතර බුදුරදුන්ගේ සුවිශේෂ ලක්ෂණය නම්,

(1) උන් වහන්සේ දෙවියෙකු හෝ බ්‍රහ්මයෙකු නොව උතුම් මනුෂ්‍යයෙකු වන බව ය.
(2) කයින් හෝ වචනයෙන් උන්වහන්සේ පව්කම් නොකරන බව ය.
(3) තමන් වහන්සේගේ චර්යාවන් ගැන වුව ද සෙවීමට ශ්‍රාවකයන්ට නිදහස දී ඇති බව ය.
(4) උන්වහන්සේට පරසිත් දන්නා නුවණ ඇති බව ය.
(5) පරාර්ථ සාධනය සඳහා බුදුරදුන් සිය ජීවිතය කැප කළ බව ය.

**2.** පුද්ගලයකුගේ සිරුරෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පරීක්ෂා කොට උස්, පහත් බව වාසනාව හෝ මතුවට ඔහුට ලැබෙන උතුම් තත්ත්වය ආදී කරුණු ප්‍රකාශ කිරීමට ඉතා ඈත අවදිවල පටන් ම භාරතීය ධර්ම ශාස්ත්‍රඥයෝ යොමු වූහ. බුදුරජාණන් වහන්සේගේ සිරුරෙහි දක්නට ලැබෙන එවන් විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) හිස් මුදුනෙහි සිරස්පතක් දක්නට ලැබීම ය.
(2) නෙරා ගිය විලුඹක් නැති බව ය.
(3) එක සමාන දත් දෙතිසක් තිබීම ය.
(4) උරහිස් දෙක අතර කුහර නැති බව ය.
(5) මුවෙකුට මෙන් සමාන හකු දෙකක් ඇති බව ය.

**3.** අප විද්‍යාලයේ බෞද්ධ සංගමය මගින් පවත්වාගෙන යන පුස්තකාලයෙහි ඇති එක්තරා ග්‍රන්ථයක බුදුරදුන් නොයෙක් පරියායෙන් ධර්මය දේශනා කර ඇති බව සඳහන් වේ. එයින් අර්ථවත් වන්නේ,

(1) ශ්‍රාවකයන් අපේක්ෂා කරන පරිදි බුදුරදුන් දහම් දෙසන්නේය යන්නයි.
(2) උන්වහන්සේ සාකච්ඡා ක්‍රමයෙන් පමණක් ධර්මය දේශනා කරන සේක යන්නයි.
(3) අනුපිළිවෙළින් ධර්ම කරුණු විස්තර කර දීමට ක්‍රියා කර ඇත යන්නයි.
(4) උන්වහන්සේගේ දේශනාව මුල, මැද මෙන් ම අග ද යහපත් ය යන්නයි.
(5) එකම කරුණ විවිධ ක්‍රමවලින් විග්‍රහ කරති යන්නයි.

**4.** විජ්ජා යනු උසස්, උතුම් ඥානයයි. සමථ විපස්සනා භාවනා මාර්ගයෙන් උපදවා ගත යුතු එබඳු උතුම් ඥානාධිගමයන් පිළිබඳ ව සූත්‍ර දේශනාවල විස්තර කොට තිබේ. බුදුරජාණන් වහන්සේ අෂ්ට විද්‍යාවකින් හෙවත් උතුම් ඥානාධිගමයන් අටකින් යුක්ත වෙති. ඉන් එකක් **නො වන්නේ,**

(1) ආසයානුසය ඥානයයි.
(2) දිබ්බසෝත ඥානයයි.
(3) මනෝමය ඍද්ධි ඥානයයි.
(4) විපස්සනා ඥානයයි.
(5) පරචිත්ත විජානන ඥානයයි.

**5.** "යම් සේ පියුමක් මඩ සහිත පොකුණක හට ගත්ත ද එහි ම වැඩී ගත්තේ ද මඩ දිය ඉක්මවා සුවඳවත් ව වර්ණවත් ව බබලන්නේ ද එසේ ම ලොව වසන නමුදු ලෝක ධර්මයන්හි නොඇලුණු එම ධර්මයන් ඉක්මවා සිටින මම බුද්ධ නම් වෙමි." මෙම අදහස හමුවන්නේ,

(1) බුද්ධවංසපාළියේ ය.
(2) මහාවග්ගපාළියේ ය.
(3) විශුද්ධි මාර්ගයෙහි ය.
(4) ද්‍රෝණ සූත්‍රයෙහි ය.
(5) විභංග ප්‍රකරණයෙහි ය.

Department of Examinations, Sri Lanka

[දෙවැනි පිටුව බලන්න.

6. "ඇසළ පෝදා උපන් දහමෙහි සුවිශේෂ ගුණ" යන මැයෙන් පුවත්පතකට කෙටි ලිපියක් සකස් කරන ලෙස එක් පිරිවෙනක දහතුන වසරේ සිසුන්ට බුද්ධ ධර්මය උගන්වන ස්වාමීන් වහන්සේ විසින් පැවරුමක් දී තිබිණ. එහි දී ස්වාක්ඛාත යන දහම් ගුණය ගැන කරුණු දැක්වූ සිසුන් විසින් ඒ සඳහා නොයෙක් අර්ථකථන ඉදිරිපත් කොට තිබිණ. ඒ අතුරෙන් නිවැරදි වනුයේ,
   (1) තම තමන් විසින් ම ධර්මය අවබෝධ කළ යුතු ය යන්නයි.
   (2) මුල, මැද, අග යහපත් කොට මැනවින් දේශනා කර තිබේ යන්නයි.
   (3) තර්කානුකූල ව ප්‍රකාශ කොට ඇත යන්නයි.
   (4) ඉක්මනින් ප්‍රතිඵල ලැබිය හැකි ය යන්නයි.
   (5) සියලු බුදුවරුන්ගේ අනුශාසනය වේ යන්නයි.

7. ලෝකයේ බොහෝ සමය සමයාන්තරයෝ භව සංක්‍රමණික ආත්මයක් ඇතැයි උගන්වති. එම ආත්මය සදාකාලික යැයි පිළිගන්නා ඔවුන්ගේ සියලු ඉගැන්වීම් ආත්ම සංකල්පය පාදකකොට ඇත. බුදුදහමෙහි සුවිශේෂී ඉගැන්වීම නම් 'සබ්බේ ධම්මා අනත්තා' යන්න ය. එහි අර්ථය වන්නේ,
   (1) ආත්මය භවයෙන් භවයට ගමන් කරයි යන්නයි.
   (2) සියල්ල මරණයෙන් කෙළවර වේ යන්නයි.
   (3) ඊශ්වරයකු මැවූ ආත්මයක් නැත යන්නයි.
   (4) සංඛත ධර්මයන් මගේ ය, මම වෙමි, මගේ ආත්මය වේ යැයි කිව නොහැකිය යන්නයි.
   (5) තමාට පිහිට තමාම ය යන්නයි.

8. ලෝකයේ එදා මෙදාතුර උපන් කිසිදු සාමයික චින්තාවෙක දක්නට නොලැබෙන සිතීමේ හා විමසීමේ නිදහසක් බුදුසමය තුළ දැක ගත හැකි ය. සහේතුකව, සකාරණව එසේ සිතා විමසා බැලීමට බුදුරදුන් දුන් නිදහස **නොකියැවෙන** ධර්මපාඨයක් ලෙස සැලකිය හැක්කේ,
   (1) තථාගතෙ සමන්නෙසනා කාතබ්බා
   (2) ආරභථ, නික්ඛමථ, යුඤ්ජථ බුද්ධ සාසනෙ
   (3) යදා තුම්හෙ කාලාමා අත්තනාව ජානෙය්‍යාථ
   (4) අනුවිච්චකාරං ඛො ගහපති කරොහි
   (5) සුත්තෙ ඔතාරෙතබ්බානි, විනයෙ සන්දස්සෙ තබ්බානි

9. බුදුරදුන්ගේ මංගල ධර්ම දේශනයෙහිම දැක්වෙන පරිදි බෞද්ධ විමුක්ති මාර්ගය මධ්‍යම ප්‍රතිපදාවකි. එසේ හැඳින්වෙනුයේ කාමසුඛල්ලිකානුයෝගයට ද අත්තකිලමථානුයෝගයට ද නොවැටෙන බැවිනි. එම අන්ත දෙකට පාදක වූයේ ශාස්වත අශාස්වත යන දෘෂ්ටිවාදයන් ය. එම අන්තවාදී, දෘෂ්ටිවාද හැරපියා බුදුරදුන් සිදු කළ මධ්‍යම දේශනාව නම්,
   (1) ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.
   (2) පටිච්චසමුප්පාද ධර්මයයි.
   (3) ත්‍රි ලක්ෂණයයි.
   (4) නාම රූප විභාගයයි.
   (5) චතුරාර්ය සත්‍ය දේශනාවයි.

10. "තමාට, අනුන්ට හා දෙපක්ෂයට ම අවැඩදායක ක්‍රියාවලින් වළකිමි. වැඩදායක ක්‍රියාවන්හි නිරතවෙමි"යි ආත්මාර්ථය ගැන මෙන් ම පරාර්ථය ගැන ද සලකා මනා ප්‍රත්‍යවේක්ෂණයකින් යුක්තව තුන්දොර ක්‍රියාවට නැඟීමට බුදුරදුන් අවවාද කර ඇත්තේ,
   (1) දීඝජානු කෝලිය පුත්‍රයාට ය.
   (2) අංගුලිමාලට ය.
   (3) රූපනන්දා භික්ෂුණියට ය.
   (4) ආලවක යක්ෂයාට ය.
   (5) රාහුල ස්වාමීන් වහන්සේට ය.

11. ශ්‍රමණ සම්ප්‍රදායට අයත් බුද්ධකාලීන පැවිද්දන්ගේ විශේෂ ලක්ෂණ කියැවෙන වාක්‍ය පහක් ලියන්නැයි පසුගිය වර්ෂාවසාන පරීක්ෂණයේ දී අප විදුහලේ උසස් පෙළ සිසුන්ට ලැබුණු ප්‍රශ්න පත්‍රයේ එක් ප්‍රශ්නයක දක්වා තිබිණ. එහිදී එක් සිසුවකු ලියූ වාක්‍ය පහෙන් එකක් **වැරදිය**. එනම්,
   (1) ශ්‍රමණ සම්ප්‍රදාය බ්‍රාහ්මණ සම්ප්‍රදායට වඩා පැරණි ය.
   (2) ශ්‍රමණයෝ බ්‍රහ්මචාරී ජීවිත ගත කළෝ ය.
   (3) පිණ්ඩපාතික වීම ශ්‍රමණයන්ට පොදු ලක්ෂණයකි.
   (4) ශ්‍රමණ ගුරුකුලවල ආගමික ඉගැන්වීම් අතර බොහෝ පරස්පරතා තිබිණි.
   (5) ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ සම්ප්‍රදායට සමකාලීන ශ්‍රමණ සම්ප්‍රදායේ ආභාසය ලැබී තිබේ.

12. බෞද්ධ භික්ෂුවකගේ ශ්‍රමණ සාරූප්‍යය, ආකල්ප හා පැවතුම් වර්ධනයට අදාළ අවවාද රාශියක් ධර්ම විනයෙහි දක්නට ලැබේ. එබඳු අවවාද අතුරෙන් එකක් **නො වන්නේ**,
   (1) මගේ ජීවිතය අනුන් සමග බැඳී ඇතැයි නිරතුරුව මෙනෙහි කිරීම ය.
   (2) ධර්මය දායාද කොට ගනිමින් ආමිසය බැහැර කිරීම ය.
   (3) මා විරූපී බවට පත්ව ඇතැයි නිතර සිහි කිරීම ය.
   (4) කිරි හා දිය මෙන් පැහී සමගියෙන් වාසය කිරීම ය.
   (5) නොපමාවම කුසල ධර්මයන් සම්පාදනය කිරීම ය.

13. පසුගිය මැදින්පුර පසළොස්වක පෝදා අප විහාරස්ථානයේ අටසිල් සමාදන්ව සිටි උපාසක උපාසිකාවන් අතර සංඝරත්නයේ නව වැදෑරුම් ගුණ අතුරෙන් දක්ඛිණෙය්‍යය යන්නෙහි අර්ථය පිළිබඳ ව සාකච්ඡාවක් ඇති විය. එහි දී ප්‍රකාශ වූ අදහස් අතුරෙන් නිවැරදි වූයේ එකක් පමණි. එනම්,
   (1) පැදකුණු කොට වැඳිය යුතු බැවින් සඟරුවන දක්ඛිණෙය්‍ය නම් වේ.
   (2) දක්ෂ ලෙස නිවන් මග ගමන් කරන යනු එහි අර්ථයයි.
   (3) එම ගුණයෙන් කියැවෙන්නේ භික්ෂූන් දැක්ම මංගල කාරණයක් බව ය.
   (4) දක්ෂිණාව පිළිගැනීමට ඉතා සුදුසු බැවින් දක්ඛිණෙය්‍ය නම් වේ.
   (5) ලෝකයට නිසිමග දක්වන බැවින් දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත ය. යන්නයි.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka

14. උපසම්පදා ශීලය හෙවත් අධි ශීලය සිඳ දමන බැවින් ඡෙජ්ජගාමිණි නම් වූ ගරුකාපත්ති හතරක් භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ දැක්වේ. උපසම්පදා ශීලය බිඳ වැටීමට හේතුවන එබඳු ඇවැතක් වන්නේ,
(1) මුසාබස් කීම ය. (2) සතුන් මැරීම ය. (3) මද්‍යසාර භාවිතය ය
(4) කාමමිථ්‍යාචාරය ය. (5) රජුන් විසින් දඬුවම් දෙන තරමේ සොරකම ය.

15. උපසපන් භික්ෂූන් වහන්සේලාගේ ආයති සංවරය, සමගිය, සසුනෙහි යහ පැවැත්ම හා අභිවෘද්ධිය ආදී බොහෝ කරුණු සාධනය වන පරිදි විනයෙහි දැක්වෙන නියමයන්ට අනුකූල ව පවත්වන ගණපූරණය සහිත සභාවක ක්‍රියාවලිය විනය කර්මයක් ලෙස හැඳින්විය හැකි ය. එවැනි විනය කර්මයක් **නො වන්නේ**,
(1) ඇවැතකට පත් භික්ෂුවකට දඬුවම් දීම ය. (2) කඨින වස්ත්‍රයක් පැවරීම ය. (3) මහණ පිංකම ය.
(4) සාමණේර භික්ෂුවක උපසම්පදා කිරීම ය. (5) පාමොක් උදෙසීම ය.

16. සිවුවනක් පිරිසෙහි ම විශේෂ හැකියා ඇගයීමට මෙන්ම ඔවුන් ධර්ම ප්‍රචාරයෙහිලා උනන්දු කරවමින් පුළුල් ප්‍රජා මෙහෙවරක යෙදවීමට ද බුදුරජාණන් වහන්සේ ක්‍රියා කළහ. ඒ අනුව ධර්ම කථික තෙරණියන් අතර අගතනතුර ලැබුයේ,
(1) ඛේමා තෙරණියයි. (2) ධම්මදින්නා තෙරණියයි. (3) භද්‍රා තෙරණියයි.
(4) මහා ප්‍රජාපති ගෝතමී තෙරණියයි. (5) සුමංගල මාතා තෙරණියයි.

17. "චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය, බහුජන සුඛාය, අත්ථාය හිතාය සුඛාය, දෙවමනුස්සානං, දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිං කල්‍යාණං, මජ්ඣෙ කල්‍යාණං, පරියොසාන කල්‍යාණං, සාත්ථං සව්‍යංජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ" බුදුරජාණන් වහන්සේ මෙම ප්‍රකාශය කළ බව සඳහන් වන්නේ,
(1) මහාසාරෝපම සූත්‍රයේ ය. (2) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(3) අරියපරියේසන සූත්‍රයේ ය. (4) මහාවග්ගපාළියේ ය.
(5) මිලින්ද පඤ්හයේ ය.

18. පසුගිය සතියේ අප දහම් පාසලේ බිත්ති පුවත්පතෙහි දහවෙනි ශ්‍රේණියේ ශිෂ්‍යාවක විසින් "ප්‍රථම ධර්ම සංගීතියට පසුබිම සැකසූ ශාසනික ගැටලු" යන මැයෙන් ලිපියක් පළකොට තිබිණ. එහි ඇතුළත්ව තිබූ කරුණු අතුරෙන් එකක් මාතෘකාවට අදාළ **නොවී ය**. එනම්,
(1) බුද්ධානුබුද්ධක ශික්ෂා විනිශ්චයයි. (2) සසුනෙහි නායකත්වය පිළිබඳ ගැටලුවයි.
(3) භික්ෂූන් අතර පැවති මතභේදයි. (4) සුභද්‍ර භික්ෂුවගේ ප්‍රකාශයයි.
(5) ඡන්න තෙරුන් පිළිබඳ ප්‍රශ්නයයි.

19. එකල්හි විශාලා නුවර වැසි වජ්ජිපුත්‍රක භික්ෂූහු දිය පිරවූ බඳුනක් තබා එයට කහවනු දමන ලෙස උපාසකවරුන්ට කීහ. උපාසකවරුද එසේ කළහ. විශාලාවට වැඩම කළ යස හිමියෝ මෙම ක්‍රියාව දැක ඊට විරෝධය දැක්වූහ. එවිට වජ්ජි භික්ෂූහු පළමුව උන්වහන්සේට උක්ඛේපනීය කර්මයද දෙවනුව පටිස්සාරණීය කර්මයද කළහ" මෙම වාර්තාව දක්නට ලැබෙන්නේ,
(1) නිකාය සංග්‍රහයේ ය. (2) පාලි බෝධිවංශයේ ය. (3) මහාවංශයේ ය.
(4) චුල්ලවග්ගපාළියේ ය. (5) සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ ය.

20. තෙවන සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් මොග්ගලීපුත්ත තිස්ස මහරහතුන් වහන්සේ විසින් පරවාද පන්සියයක් සහ සකවාද පන්සියයක් ද ඇතුළත් කොට සම්පාදනය කළ කථාවත්ථුප්පකරණය අභිධර්මපිටකයකට එක් කළ බව සඳහන් වේ. එයින් පැහැදිලි වන කරුණක් **නො වන්නේ**,
(1) නිකායාන්තර මතභේද උග්‍ර වී තිබූ බව ය.
(2) ථෙරවාද බෞද්ධ ඉගැන්වීම්වල ධර්මානුකූල බව පෙන්වා දීමට එමගින් උත්සාහ කළ බව ය.
(3) සතර පරමාර්ථ ධර්ම වෙන් කොට දැක්වීමට එහිදී ථෙරවාදීන් පෙළඹුණු බව ය.
(4) ථෙරවාදීන් ප්‍රතිපක්ෂ මත බිඳ දැමීමට ක්‍රියා කළ බව ය.
(5) බෞද්ධ ඉගැන්වීම් වැඩිදුරටත් විග්‍රහ වූ බව ය.

21. ප්‍රථම ධර්ම සංගායනාවේ දී බුද්ධ දේශිත සූත්‍ර ධර්මයන් නිකාය වශයෙන් කොටස් පහකට ගොනු කරන ලද බවට සාම්ප්‍රදායික මූලාශ්‍රය සාක්ෂි දරයි. පඤ්ච නිකාය ග්‍රන්ථයන්හි බුද්දක නිකාය ද ඇතුළත් ය. ඒ පිළිබඳ ව විද්වතුන් විසින් ප්‍රකාශ කරන ලද අදහසක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) බුද්දක නිකායේ සියලු ග්‍රන්ථ ආදි බුද්ධ වචනය නිරූපණය කරයි යන්න ය.
(2) ජාතකපාළිය කථා වස්තු සංග්‍රහයෙකි යන්න ය.
(3) බුද්දක නිකාය කාලයත් සමග සංවර්ධනය වී ඇත යන්න ය.
(4) ථෙරවාදී බුදුදහමට මුල්වී ඇත්තේ ථෙරථෙරී ගාථාවන් යන්නයි.
(5) පටිසම්භිදාමග්ගය පසුව අභිධර්ම පිටකයට එක් වී තිබේ යන්නයි.

22. විනය පිටකය හඳුන්වා දෙන කෙටි වාක්‍ය පහක් ලියන්නැයි එක් පිරිවෙන් විද්‍යාස්ථානයක උසස් පෙළ සිසුන්ට බුද්ධ ධර්මය උගන්වන ස්වාමීන් වහන්සේ පැවරුමක් ලබා දුන්හ. එහිදී එක් ශිෂ්‍යයකු ලියා තිබූ පහත දැක්වෙන වාක්‍ය පහෙන් එකක් **වැරදිය**. එනම්,
(1) ඛන්ධක නමින් දැක්වෙනුයේ විනය අට්ඨ කථාවයි.
(2) උභතොවිභංගයම විනය පිටකයට ඇතුළත් වේ.
(3) මහාවග්ගපාළිය ඛන්ධක දහයකින් සමන්විත ය.
(4) "විනය සසුනේ ආයුෂය වේ." යන්න බුද්ධ වචනයක් නොවේ.
(5) විනය ආනා දේශනා ලෙස ද හැඳින්වේ.



Department of Examinations, Sri Lanka

3864

23. අභිධර්මය හැඳින්වෙන්නේ ධර්මයට අතිරේකව එයට විශේෂ අර්ථ දක්වන දේශනාවක් ලෙස ය. එය බුද්ධ වචනය ආශ්‍රිත වර්ධනයකි. පසුකාලීන පෙළගැස්මකි. සියුම් දාර්ශනික ප්‍රකාශනයෙකි. එහෙත් අභිධර්මය පිළිබඳ ව කියැවෙන පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් එකක් **වැරදි** ය. එනම්,
(1) අභිධර්මය නිප්පරියාය දේශනාවකි.
(2) සූත්‍රවල එන මාතිකා සංවර්ධනය කිරීමක් එහි දැකගත හැකි ය.
(3) අභිධර්ම පිටකයෙහි පැරණි භාරතීය සමාජ තොරතුරු ඇතුළත් නොවේ.
(4) ථෙරවාද අභිධර්මය ක්‍රි. පූ. පස්වැනි සියවසට අයත් ය.
(5) එමගින් ධර්මවාදයක් ඉදිරිපත් කෙරේ.

24. බුද්ධඝෝෂ මාහිමියන්ගේ ශ්‍රී ලංකා සම්ප්‍රාප්තියෙන් පසු දඹදිවින් මෙහි වැඩම කළ ධර්මධර මහ තෙරුන්වහන්සේ ලක්දිව විසූ වියත් මහ තෙරවරුන් සමග එක්ව පාලි අට්ඨකථා සම්පාදනය කළ බව ඉතිහාසයේ සඳහන් වේ. එතෙක් පැවති සීහල අට්ඨකථා පසුව අභාවයට ගියේ ය. පාලි අට්ඨකථා ඇතු ද සුරකී පවතී. ඒ තුළ සිදු වී **නැත්තේ**,
(1) ථෙරවාදී ආචාර්ය මතයට අනුගත වීම ය.
(2) තුන් පිටකය වැඩිදුරටත් අර්ථකථනය කිරීම ය.
(3) මහායාන අදහස් විවේචනය කිරීම ය.
(4) සූත්‍ර ධර්මයන්ගේ ආදර්ශය ලබා ගැනීම ය.
(5) සීහල අට්ඨකථාවේ එන ඇතැම් කරුණු තහවුරු කිරීම ය.

25. වළගම්බා රාජ්‍ය සමයේ ධර්ම විනයධර මහතෙරුන්වහන්සේලා මාතලේ ආලෝක විහාරයට රැස්වී සිදු කළ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ ඓතිහාසික ශාසනික මෙහෙවර අපේ සාම්ප්‍රදායික මූලාශ්‍රය තුළ වාර්තා වේ. ඒ සඳහා මෙරට භික්ෂූන් පෙළඹවූ හේතුවක් ලෙස දැක්විය **නො හැක්කේ**,
(1) දිගු කලක් පැවති යුද කෝලාහල නිසා ත්‍රිපිටකය මුඛ පරපුරෙන් පවත්වාගෙන යාමට බාධා ඇති වීම ය.
(2) නිකායාන්තර මතභේද ඔස්සේ ථෙරවාදී ධර්ම විනය විෂම අදහස්වලින් ව්‍යාකූල වීම වළක්වා ගැනීම ය.
(3) බැමිණිතියා නම් සාගතය තුළින් භික්ෂූන් ලැබූ කටුක අත්දැකීම් ය.
(4) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම වඩා ඵලදායක බව පෙනී යාම ය.
(5) අන්‍යාගමික බලවේගවලින් පිරිසිදු ථෙරවාදී ධර්මයට හානියක් වීමට ඇති ඉඩකඩ වළක්වා ගැනීම ය.

26. වෛදික බ්‍රාහ්මණයන් ඉගැන්වූ විමුක්ති මාර්ගය හැඳින්වෙන්නේ කර්ම මාර්ගය ලෙස ය. එනම් දෙවියන් උදෙසා යාග කර්ම හෝම කර්මාදී බාහිර පුද සිරිත් පැවැත්වීමයි. යාග පැවැත්වීමට බ්‍රාහ්මණයන්ගේ සහාය අවශ්‍ය විය. ඒ අනුව උද්ගාතෘ නම් වූ බ්‍රාහ්මණ පූජකයාගේ කාර්යභාරය වූයේ,
(1) දෙවියන්ට ආරාධනා කිරීමයි.
(2) පැමිණි දෙවියන්ගේ ගුණ කියමින් ස්තුති මන්ත්‍ර ගායනයයි.
(3) යාග පූජාව සිදු කිරීමයි.
(4) යාගයෙහි අඩුපාඩු ඇත්දැයි සොයා බැලීමයි.
(5) යාග කර්මයේ ආනිසංස ප්‍රකාශ කිරීමයි.

27. ඉන්ද්‍රිය ගෝචර සත්තාවන් පමණක් පිළිගැනීමට, දෙවියන් වහන්සේ, ආත්මය, පරලොව, කර්මය, යාගය ආදී ආගමික සංකල්ප බැහැර කිරීමට හා දිවි ඇතිතෙක් පස්කම් සුව විඳීමට ඇතැම් බුද්ධකාලීන චින්තකයන් ඉගැන්වූ බව ප්‍රකට ය. එම ඉගැන්වීම් හැඳින්විය **නො හැක්කේ**,
(1) භෞතික වාදය යනුවෙනි.
(2) ලෝකායත වාදය යනුවෙනි.
(3) උච්ඡේද වාදය යනුවෙනි.
(4) අකිරිය වාදය යනුවෙනි.
(5) සයංකත වාදය යනුවෙනි.

28. අග්ගඤ්ඤ සූත්‍රය අනුව මිනිස් සමාජය විවිධ හේතු ප්‍රත්‍ය ඔස්සේ පරිණාමයට පත්ව ඇත. ඒ අනුව විවිධ සමාජ සංස්ථා බිහිවී තිබේ. නොයෙක් සමාජ විෂමතා ද හටගෙන ඇත. ඒ සියල්ලටම තුඩු දුන් එක් මානව ක්‍රියාකාරකමක් එම සූත්‍රයේ හැඳින්වෙන්නේ "දිට්ඨානුගතිය" යනුවෙනි. ඉන් අදහස් වන්නේ,
(1) කිසියම් දෘෂ්ටිවාදයක එල්බ ගැනීමයි.
(2) ගතානුගතිකත්වයට වහල් වීමයි.
(3) දුටු දේ අනුකරණය කිරීමයි.
(4) විෂමාචාරවලට නැඹුරු වීමයි.
(5) දුටු දේ සුභ වශයෙන් ගැනීමයි.

29. සියලු සංස්කාර ධර්මයන් අනිත්‍යය. දූලි බිඳක් තරම්වත් නිත්‍ය වූ ධර්මයක් ලොව නැත. සසර දුකට මෙකී අනිත්‍යභාවයම පාදක වෙයි. බුදුදහමෙහි ප්‍රධාන ඉගැන්වීමක් වන අනිත්‍යතාව පිළිබඳ ව සඳහන් වන බුද්ධ දේශනාවක් නම්,
(1) ධම්මික සූත්‍රයයි.
(2) කන්දරක සූත්‍රයයි.
(3) පත්තකම්ම සූත්‍රයයි.
(4) නඛසිඛා සූත්‍රයයි.
(5) වනරොප සූත්‍රයයි.

30. මාසිකව ධර්ම සාකච්ඡාවක් පැවැත්වීම අප සුභ සාධක සමිතිය කලක සිට සිදු කළ ආගමික කටයුත්තකි. පසුගිය ඉරු දින පැවැත්වූ සාකච්ඡාවේ මාතෘකාව වූයේ සිගාලෝවාද සූත්‍රයේ මව්පිය දූ දරු වගකීම් යන්නයි. මව්පියන් විසින් දරුවන් උදෙසා පළමුව සිදු කළ යුතු යැයි සූත්‍රයේ සඳහන් වන කරුණ නම්,
(1) හොඳ නරක කියා දීමයි.
(2) දායාද පැවරීමයි.
(3) අධ්‍යාපනය ලබා දීමයි.
(4) වැඩිහිටියන් හඳුන්වා දීමයි.
(5) සිරිත් විරිත් කියා දීමයි.

31. චතුරාර්ය සත්‍යය පිළිබඳ ත්‍රිවිධ වටයක් හා ආකාර දොළහක් දම්සක් පැවතුම් සූත්‍රයේ දක්වා තිබේ. ඒ අනුව ජාති, ජරා, ව්‍යාධි මරණාදී වශයෙන් සසර වසන සත්ත්වයාට උරුමව ඇති දුක පිළිබඳ සත්‍යය,
(1) ප්‍රහීණ කළ යුතු ය.
(2) අවබෝධ කළ යුතු ය.
(3) සාක්ෂාත් කළ යුතු ය.
(4) වැඩිය යුතු ය.
(5) යටපත් කළ යුතු ය.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**32.** පසුගිය සතියේ දිනෙක එක්තරා අවමගුල් උත්සවයක් අවසන් කොට රාත්‍රියෙහි නිවසට රැස්වූ ඥාතිමිත්‍රාදීහු මරණ දුක හා ඉන් අත්මිදීමෙන් ලබන නිවන ගැන කතාබහක යෙදුණෝ ය. එහි දී පළවූ අදහස් අතුරෙන් ධර්මානුකූල වූයේ එකක් පමණි. එනම්,
(1) නිර්වාණය යනු සියල්ල මරණින් කෙළවර වීම ය.
(2) නිවන පාරභෞතික සංකල්පයකි.
(3) ස්වර්ගගාමී වීම නිවනයි.
(4) එය බුද්ධාදී උතුමන්ගේ අත්දැකීම වේ.
(5) සාරධර්ම ඉක්මවා යාම නිවනයි.

**33.** බුදුරදුන් වදාළ නිවන් මග අංග අටකින් යුක්ත ය. එය හැඳින්වෙන්නේ දුක්ඛ නිරෝධගාමිනී පටිපදා ආර්ය සත්‍යය යනුවෙනි. එහි දෙවැනි මාර්ගාංගය වන සම්මා සංකප්ප යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) චතුරාර්ය සත්‍යය පිළිබඳ ඥානයයි. (2) දසවස්තුක මිථ්‍යා දෘෂ්ටිය බැහැර කිරීමයි.
(3) සතර සතිපට්ඨාන ධර්ම දියුණු කිරීමයි. (4) කාමයෙන්, ව්‍යාපාදයෙන් හා හිංසාවෙන් තොර වීමයි.
(5) ප්‍රථම ධ්‍යානාදිය උපදවා ගැනීමයි.

**34.** ගිහි බෞද්ධයකු විසින් නිතිපතා ආරක්ෂා කළ යුතු ප්‍රතිපදාව පඤ්ච ශීලයයි. එබැවින් එය ගෘහස්ථ ශීලය ලෙස ද නිත්‍ය ශීලය ලෙස ද හැඳින්වේ. එම ශීලය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) අඹුදරුවන් පෝෂණය කරමින් පන්සිල් රැකිය නොහැකි ය.
(2) කාමේසුමිච්ඡාචාරා වේරමණී යන්නෙන් පස්කම් සැප අත්හැරීමට ඉගැන්වේ.
(3) පන්සිල් රැකීමෙන් නිවන් දැකිය හැකි ය.
(4) සක්විති රජෙකු වුව ද පඤ්ච ශීලය ආරක්ෂා කළ යුතු ය.
(5) පන්සිල් රැකීම සුදුසු වන්නේ බෞද්ධයකුට පමණි.

**35.** සියලු අබෞද්ධ මතවාදයන් බැහැර කිරීමටත්, බෞද්ධ ඉගැන්වීම් තහවුරු කිරීමටත් උපකාරී වන පටිච්ච සමුප්පාද දේශනාව පිළිබඳ ව කිව හැකි නිවැරදි අදහස නම්,
(1) බුදුවරු උපන්න ද නූපන්න ද එම දහම ලොව පවතින බව ය.
(2) එමගින් හේතුවත්, ඵලයත් එකක් ලෙස දැක්වෙන බව ය.
(3) නිවනෙහි පවා හේතුඵල සම්බන්ධයක් ඇති බව ය.
(4) පටිච්චසමුප්පාදය, අධිච්චසමුප්පන්නවාදයට සමාන බව ය.
(5) කුසලාකුසල කර්ම පටිච්චසමුප්පන්න නොවේ යන්නයි.

**36.** සංසාරගත දුකෙහි සමුදයත් නිරෝධයත් උගන්වන අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙයාකාර වූ පටිච්චසමුප්පාද දේශනා-වේ ඇතුළත් සංඛාර යන්නෙන් අදහස් **නො වන්නේ,**
(1) පුණ්‍ය කර්ම හා පාප කර්මයි.
(2) කාය සංඛාර, වචී සංඛාර හා මනො සංඛාරයි.
(3) ස්කන්ධ, ධාතු, ආයතන ආදියයි.
(4) සවැදෑරුම් චේතනා කායයි.
(5) පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර හා අනෙඤ්ජාභි සංඛාරයි.

**37.** බුදුදහම මිනිසා සතු කායික මෙන් ම මානසික ශක්තිය ද අගය කරයි. එම ශක්තීන් උපයෝගී කොට ගෙන සියලු යහපත උදාකර ගත හැකි යැයි පිළිගනියි. එසේ මානව ශක්‍යතාව අගය කිරීම පිණිස බුදුරදුන් භාවිත කළ ව්‍යවහාර අතුරෙන් එකක් **නො වන්නේ,**
(1) පදාන (2) පරක්කම (3) බල (4) විරිය (5) අනුට්ඨාන

**38.** බුදුදහම අනුව සමථ භාවනාව වඩන්නා විසින් සම සතලිස් කර්මස්ථාන අතුරෙන් සිය චරිතයට ගැළපෙන කර්මස්ථාන තෝරාගත යුතු ය. එකී කර්මස්ථාන අතරට **නො වැටෙන්නේ,**
(1) දස අසුභ ය. (2) දස අනුස්සති ය. (3) දස පින්කිරියවත් ය.
(4) දස කසිණ ය. (5) සතර ආරුප්ප ය.

**39.** එක් භාවනා මධ්‍යස්ථානයක උපාසක උපාසිකාවන් ඇමතූ කර්මස්ථානාචාර්ය හිමිපාණෝ විපස්සනා භාවනාව පිළිබඳ ව තම තමන් දන්නා දේ පවසන්නැයි ඉල්ලා සිටියහ. එහි දී ප්‍රකාශ වූ අදහස් අතුරෙන් එකක් පමණක් නිවැරදි විය. එනම්,
(1) සමථ භාවනාව නොවඩා විපස්සනාව වැඩිය හැකි ය.
(2) ත්‍රිලක්ෂණ භාවනාව ම විදර්ශනාව ලෙස හැඳින්වේ.
(3) විදසුන් වැඩීමෙන් කෙලෙස් යටපත් වේ.
(4) නිවන් අවබෝධයට විපස්සනාව අදාළ නොවේ.
(5) පරචිත්ත විජානන ඥානය ලැබෙන්නේ සමථයෙන් නොව විදර්ශනාවෙනි.

**40.** බෞද්ධයකු විසින් යම් ක්‍රියාවක් කුසල කර්මයක් ද අකුසල කර්මයක් දැයි විනිශ්චය කළ යුත්තේ කවර කරුණු සැලකිල්ලට ගැනීමෙන් දැයි බුදුදහමේ සඳහන් වේ. එම කරුණු අතුරෙන් එකක් නම්,
(1) උභයාර්ථයම අවධානයට යොමු කිරීම ය. (2) බහුතරයේ කැමැත්ත සලකා බැලීම ය.
(3) ආචාර්යවරයාගේ මග පෙන්වීම ය. (4) පාරම්පරික පිළිගැනීමට අනුගත වීම ය.
(5) පිටක සම්ප්‍රදායට එකඟ වීම ය.

Department of Examinations, Sri Lanka

[හයවැනි පිටුව බලන්න.

**41.** බුද්ධාදි රත්නත්‍රය අරබයා සහේතුව, සකාරණව ඇති කරගත් ප්‍රසාදය සද්ධාවයි. එය වපුරා ඵල ලැබිය හැකි බීජයක් ලෙස ද, මිනිසාට ප්‍රයෝජනවත් බලයක් ලෙස ද, නිවන් මගෙහි පිවිසුම ලෙස ද ධර්ම ග්‍රන්ථවල දක්වා තිබේ. අටුවාවන්හි සද්ධාව පිළිබඳව දක්වා ඇති ප්‍රභේද අතුරෙන් එකක් නම්,

(1) ආධ්‍යාත්මික, බාහිර
(2) ආගම, අධිගම
(3) සාසව, අනාසව
(4) පරියාය, නිප්පරියාය
(5) සෙඛ, අසේඛ

**42.** ශීලය සමාධිය හා ප්‍රඥාව අනුපිළිවෙළින් වැඩි දියුණු කිරීමෙන් දෙලොව යහපත මෙන් ම නිවන ද උදාකරගත හැකි ය. මෙම ශික්ෂා තුන පිළිබඳ ධර්ම විරෝධී වටහා ගැනීමක් ලෙස සැලකිය හැක්කේ,

(1) සීලය බලයෙකි.
(2) සීලයෙන් තොර සමාධියක් නැත.
(3) නොකළ යුත්ත නොකිරීම මෙන් ම කළ යුත්ත කිරීම ද සීලයයි.
(4) සීලබ්බත පරාමාසය ධර්මානුකූල ය.
(5) සීලය ආදි චරණයකි.

**43.** සසර දුක් ඇති කරන නිවන වළකාලන අකුසල ධර්ම කවරේ දැයි නොයෙක් අයුරින් බුදුදහමෙහි පැහැදිලි කොට ඇත. එසේම අකුසල් නොකිරීමටත්, කුසල් කිරීමටත් නිරතුරුව ම උගන්වා තිබේ. නොකළ යුතු යැයි අවධාරණය කෙරෙන අකුසල ධර්ම දහයෙකි. ඉන් එකක් නම්,

(1) අබ්‍රහ්ම චර්යාවයි.
(2) සූදු ක්‍රීඩාවයි.
(3) සම්ඵප්‍රලාපයයි.
(4) මද්‍යසාර භාවිතයයි.
(5) අල්ලස් ගැනීමයි.

**44.** බුදුදහම තුළ අප අත්හළ යුතු ක්‍රියාවන් පාප-අකුසල ආදී ව්‍යවහාර මගින් ද වැඩිය යුතු ක්‍රියාවන් කුසල-පුඤ්ඤ ආදී ව්‍යවහාර මගින් ද දක්වා තිබේ. එසේ නොකළ යුත්ත නොකිරීමත් කළ යුත්ත කිරීමත් උගන්වා **නැත්තේ**,

(1) දස කුසල්වල ය.
(2) දස රාජ ධර්මවල ය.
(3) දස පින් කිරියවත්වල ය.
(4) දස පාරමිතාවල ය.
(5) ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවල ය.

**45.** මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනු සිවුබඹ විහරණයෝ ය. එම සාරධර්ම සතර වෙන් වෙන් ව දක්වා ඇත්තේ ඒවා අතර ඇති වෙනස්කම් සලකාගෙනයි. ඒ අනුව මෙත්තාව හා කරුණාව අතර ඇති වෙනස කියැවෙන ප්‍රකාශය නම්,

(1) මෙත්තාව නැති වුව ද කරුණාව වැඩිය හැකි ය යන්නයි.
(2) කරුණාව බුදුගුණයකි, මෙත්තාව සඟ ගුණයකි යන්නයි.
(3) මෙත්තාව සියලු සත්ත්වයන්ට ය, කරුණාව දුකට පත්වූවන්ට ය යන්නයි.
(4) කරුණාව උපේක්ෂාව හා බැඳේ, මෙත්තාව මුදිතාව හා බැඳේ යන්නයි.
(5) මෙත්තාව භාවනාවකි, කරුණාව එසේ නොවේ යන්නයි.

**46.** ගිහියකු විසින් උපයා ගත් ධනය මනා කළමනාකරණයකින් යුතුව පරිහරණය කළ යුතු ආකාරය උගන්වන බුද්ධ දේශනා රැසකි. ඒ අතුරෙන් ව්‍යග්ගපජ්ජ සූත්‍රයට ප්‍රමුඛත්වයක් ලැබේ. සමජීවිකතාවෙන් යුතුව ධනය පරිහරණය කිරීමට උගන්වන එහි ඇතුළත් උපමාවක් නම්,

(1) අලගද්දූපමාවයි.
(2) සුපිනකූපමාවයි
(3) අන්ධවෙණූපමාවයි
(4) තුලාධාරෝපමාවයි.
(5) කදලූපමාවයි

**47.** කූටදන්ත සූත්‍රය රාජ්‍ය පාලකයකු විසින් නීතිය හා සාමය මැනවින් පවත්වා ගෙන යමින් රටක ආර්ථිකය ද සංවර්ධනය කළ යුතු අයුරු පැහැදිලි කරන වෘත්තාන්ත ශෛලියෙන් කළ දේශනාවකි. එහි කියැවෙන දස්සුබීලය යනු,

(1) රජු කෙළෙස් වසඟ වී ක්‍රියා කිරීමයි.
(2) බදු නොගෙවන ජනතාව රජුට එරෙහි වීමයි.
(3) දාස දාසයින්ට නිසි වැටුප් නොගෙවීමයි.
(4) ලෝල ජාතිකයකු විසින් රස පොළොව දිවගා බැලීමයි.
(5) සොර බියෙන් හා බදු බරින් පීඩනයට පත්වූවන් රජුට එරෙහිව ඇති කළ කැරැල්ලයි.

**48.** චක්කානුවත්තන සූත්‍රයේ සඳහන් පරිදි සක්විති රජු තුළ වටිනා මූලික ගුණාංග පහක් ඇත. මත්තඤ්ඤූ යන්න ඉන් එකකි. එයින් ඉගැන්වෙනුයේ,

(1) මද්‍යසාර භාවිතයේ ආදීනව දැන සිටීමයි.
(2) සීමාව නොඉක්මවා කටයුතු කිරීමයි.
(3) බුද්ධිමත්ව ක්‍රියා කිරීමයි.
(4) ඉසුරු මදයෙන් මත් නොවීමයි.
(5) කාලය මැනවින් කළමනාකරණය කර ගැනීමයි.

**49.** එක්තරා රාජ්‍ය පාලකයකු අගතිගාමීත්වයෙන් තොරව අවංකව රාජ්‍යය පාලනය කිරීමට අසමත් වූ නිසා මහජන විරෝධයක් පැන නැගුණු බවත් මහජනයා විසින් ඔහු නෙරපා ඇමුණු බවත් ජාතක කතාවෙක දැක්වේ. එම රාජ්‍ය පාලකයා විසින් කඩකර ඇත්තේ,

(1) අත්ථ චරියාවයි.
(2) මුදිතා ගුණයයි.
(3) අක්‍රෝධයයි.
(4) අජ්ජව ගුණයයි.
(5) පෙත්තික විනයයි.

**50.** බුදුරජාණන් වහන්සේ විසින් විවිධ සූත්‍ර දේශනාවලදී මහජන යහපත උදාකරන ප්‍රායෝගික උපදෙස් රැසක් පාලකයන් සඳහා ලබා දී ඇති බව ප්‍රකට ය. ඉන් එක් උපදේශයක් නම්,

(1) රාජා චක්කවත්ති ථූපාරහො
(2) ධම්මිකං රක්ඛාවරණ ගුත්තිං සංවිධහස්සු
(3) අනුජානාමි භික්ඛවෙ රාජානං අනුවත්තිතුං
(4) උට්ඨාතා වින්දතෙ ධනං
(5) අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සමානා විහරථ

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka